චක්‍රලේඛ අංක : 06/2009

මගේ අංකය : බප/සසේකො/ලේ.නිර්/2009
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2009.06.19

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම් , ස.ණ.ස. සමිති හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමිතිවල
සභාපතිවරුන් වෙත.

<u>වයස අවුරුදු 57 න් පසු සේවකයින්ගේ සේවා කාලය අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීම.</u>

ඉහත සඳහන් කරුණ සම්බන්ධව නිකුත් කර ඇති අංක 5/96, 6/2005, 6/2005(1) සහ 6/2005(11) යන චක්‍රලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ.

සමූපකාර සමිති විසින් සේවකයින්ගේ සේවා කාලය වයස අවුරුදු 57 න් ඔබ්බට අවුරුදු ... වා දීර්ඝ කිරීමේදී අනුගමනය කරන ක්‍රියා කලාපයන් පිළිබඳ නොයෙකුත් පැමිණිලි ලැබෙන මින් ඉදිරියේදී පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු බව කොමිෂන් සභාවේ පරිදි දන්වා සිටිමි.

(අ) සැම සේවකයකුටම සිය කැමැත්ත පරිදි වයස අවුරුදු 57 සම්පූර්ණ වන දින දක්වා සේවයේ යෙදිය හැකි අතර ඉන් ඔබ්බට සේවයේ යෙදීම සඳහා වසරින් වසර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තෙමසකට පෙර දැනුම් දී සේවා කාලය දීර්ඝ කරගත යුතුය. සේවා කාලය දීර්ඝ කිරීමේ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. වයස අවුරුදු 60 සම්පූර්ණ වන දින සිට සැම සේවකයකුම අනිවාර්යයෙන්ම විශ්‍රාම ගැන්විය යුතුය.

(ආ) කිසියම් සේවකයකුගේ සේවා කාලය වයර 57 න් ඔබ්බට දීර්ඝ නොකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරනු ලබන්නේ නම්, ඊට හේතු සහිතව අවම වශයෙන් දෙමසකට පෙර කොමිෂන් සභාව වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන හේතු කොතෙක් දුරට සාධාරණද යන්න සලකා බලා කොමිෂන් සභාව විසින් තීරණයක් ගනු ලබන අතර එම තීරණය අවසන් තීරණය වේ.

(ඇ) කොමිෂන් සභාව විසින් එකී හේතුවල සාධාරණත්වය තහවුරු කර ගැනීම සඳහා සේවකයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරියේ කරුණු පරීක්ෂා කර බැලීම අවශ්‍යයැයි අදහස් කරන අවස්ථාවලදී දෙපක්ෂය කැඳවා කරුණු විභාග කරනු ඇත.

03. මෙම චක්‍රලේඛය සියළුම සේවකයින්ගේ අනුදැනුමට ඉදිරිපත් කළ බව තහවුරු කර ගැනීම සඳහා මෙහි පිටපතක් සියළුම ස්ථිර සේවකයින්ගේ අත්සන් සහිතව ගොනුකර තබා ගැනීමට සමිති විසින් ක්‍රියා කළ යුතුය.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

ජේ. ජේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

<u>පිටපත්</u>

1. බ.ප. ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්